සීතාවකපුර නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 17 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2** තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පහත සඳහන් වටිනාකම් ගිණුම් වලින් අත්හැරී තිබුණි.
  **i.** රු.135,684 ක් වූ නාගරික සංවර්ධන අධිකාරි ඉතුරුම් ශේෂය
  **ii.** රු.770,000 ක් වටිනා Bail යන්ත්‍රය

(ආ) පසුගිය වර්ෂයේ මිල දී ගත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කිරීමේ වරද, නිවැරදි නොකිරීම නිසා ලී බඩු සවිකිරීම් ගිණුම රු.232,866 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.**3.2** නොසැසඳු පාලන ගිණුම්

----------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාළව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.80,894,479 ක් වූ අතර ඊට අදාල උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.58,411,400 ක් විය.

1.**3**.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.19,607,301 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.3.4 නිරවුල් නොකරන ලද ගිණුම්

(අ) රු.3,358,259 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) රාජ්‍ය ආයතනවලට ගෙවිය යුතු එකතුව රු.12,928,750 ක් වූ ශේෂයක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,830,079 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,647,822 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත, තථ්‍ය හා හිඟ ආදායම් පිළිබඳ සාරාංශ ගත තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | **2015** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | **2016 ජනවාරි හිඟ ශේෂය** | **බිල් කිරීම** | **තථ්‍ය අයකර ගැනීම** | **2016දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** | **2015 ජනවාරි 01 දිනට හිඟ ශේෂය** | **වර්ෂයේ බිල් කිරීම්** | **තථ්‍ය අයකර ගැනීම** | **2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| වරිපනම් බදු | 10,159,184 | 19,117,983 | 23,079,467 | 6,880,726 | 5,610,272 | 19,512,094 | 15,751,082 | 10,159,184 |
| කඩ කුලී | 4,004,777 | 21,171,502 | 21,517,764 | 3,658,514 | 3,054,217 | 18,196,985 | 17,527,829 | 3,723,373 |
| බලපත්‍ර ගාස්තු | 43,542 | 184,682 | 184,682 | 43,542 | 43,543 | 311,655 | 311,655 | 43,543 |
| ව්‍යාපාර බදු | 46,915 | 578,000 | 578,000 | 46,915 | 46,915 | 676,500 | 675,500 | 46,915 |

2.2.2 පරිසර බලපත්‍ර ගාස්තු

------------------------

2016 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ස්ථාන පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර නොතිබුනි. පරිසර බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවූ නැවත බලපත්‍රය අළුත්කර ගැනීමක් සිදුකර නොතිබූ ව්‍යාපාර ආයතන 03 කින් රු.12,000 ක් ද පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබූ ව්‍යාපාර 09 කින් රු.36,000ක් ද සභාවට අහිමි වී තිබුණි.

2.2.3 කඩකුලී

----------

නව සාප්පු සංකීර්ණයේ කඩ කාමර 03 ක බදු කාලය 2015 නොවැම්බර් 21 දින අවසන්ව තිබියදී, නැවත ගිවිසුම්ගත වීමකින් තොරව 2016 සැප්තැම්බර් 28 දින තෙක් රැඳී සිටීමට ඉඩ දී තිබුණි. එකී බදුකරු ඉවත්ව ගිය පසු 2017 පෙබරවාරි 07 දින වන විටත් එකී කඩ කාමර නැවත ටෙන්ඩර් කර බදු දීමට කටයුතු නොකිරීම නිසා සභාවට අහිමි වූ කඩ කුලී ආදායම රු.150,500 ක් විය.

**3**. මෙහෙයුම් සමාලෝචනය

**-------------------------**

3.**1** කළමනාකරණ අකාර්යක්ෂමතා

**--------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2016 නොවැම්බර් 19 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ LGD/13/2016 චක්‍රලේඛය පරිදි වර්ෂ 03 කට වරක්වත් බදු කුලිය සංශෝධනය කළ යුතු වුවද සභාව විසින් කඩ කාමර බදු දීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ස්ථාන මාරු වී ගිය, නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු.197,089 ක ණය ශේෂයක් ද, සේවය අතහැර ගිය හා මියගිය නිලධාරීන් 23 දෙනෙකුගෙන් අයවිය යුතු රු.148,098 ක ණය ශේෂයක් ද 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගෙන නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------

මුදල් වටිනාකමක් හෝ ලැබුනු දිනයක් අනාවරණය නොවන, පළාත් පාලන කොමසාරිස් මඟින් සභාව වෙත ලැබී තිබූ, ප්ලාස්ටික් කුඩු කරන යන්ත්‍රය (Crusher) 2017 මැයි 09 දිනවන විටත් කසළ කළමනාකරණ අංගනයේ නිෂ්ක්‍රීයව පැවතුනි.

3.3 සණ අපද්‍රව්‍ය කළමණාකරණය
----------------------------------

(අ) සභාවට අයත් ‘‘කොටබොඩවත්ත’’ කසළ අංගනයේ ඉදිකර තිබූ පැති බැම්ම ස්ථාන තුනකින් පමණ පුපුරා ගොස් තිබූ බැවින් ඒ ආසන්නයේ සභාව විසින් ඉදිකර ඇති ප්‍රජාශාලාව හා ග්‍රාම නිලධාරි කාර්යාලය සහිත ගොඩනැගිල්ලට අලාභ හානි වීමේ අවදානමක් පැවතුනු අතර ඒ අසල පිහිටා ඇති රාජ්‍ය සේවක ගම්මානයේ පදිංචිකරුවන්ට මෙන්ම කසල අංගනය අවට අනවසර පදිංචිකරුවන්ගේ සෞඛ්‍යතත්වය පිරිහීම හා බෝවන රෝග පැතිර යාමේ අවදානමක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුනු පොලිතීන් කුට්ටි කිරීමේ යන්ත්‍රය (Bailing Machine) කාර්යක්ෂමව භාවිතයට නොගැනීම හේතුවෙන් කුණු කන්දට එකතු වන පොලිතින් ප්‍රමාණය අවම කර ගත නොහැකි වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

2016 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩ සටහන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර. ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 අයවැය පාලනය
--------------------

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පාලනය
(ඇ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර විගණනය